# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2312/38 - 2022 දෙසැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XVI) බී

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

*වැඩ බලන* ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2022 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය

නියමාවලිය

1. මේ නියමාවලිය 2022 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට බලාත්මක විය යුතු ය.

2. 2019 මාර්තු මස 22 වන දින, අංක 2115/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත, 1980 අප්‍රේල් මස 10 වන දින, අංක 83/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 10 වන ඡේදයේ (1)(අ)(vi) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන් :-

''(vii) සෞඛ්‍ය විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ වෛද්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා.'' ;

1A - PG 6129 — 66 (2022/12)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(2) එහි 13 වන ඡේදයේ -

(i) එම ඡේදයේ (1) වන අනුඡේදයේ (v) වන අයිතමය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(v) මූලික වෛද්‍ය විද්‍යාවන්" ;

(ii) එම ඡේදයේ (1) වන අනුඡේදයේ (අජ) වන අයිතමය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(අජ) ක්‍රීඩා සහ අභ්‍යාස වෛද්‍ය විද්‍යාව" ;

(iii) එම ඡේදයේ (1) වන අනුඡේදයේ (අඹ) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :-

"(අඹ) මුඛ හා හකු ශල්‍ය වෛද්‍ය විද්‍යාව." ;

(3) එහි 14 වන ඡේදයේ -

(i) එම ඡේදයේ (3අ) වන අනුඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(3අ) දන්ත ශල්‍ය වෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අධ්‍යයන සභාවක් පිහිටුවනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඇ) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල දන්ත වෛද්‍ය විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන් විසින්, අදාළ අධ්‍යයන අංශවල සහ අංශවල නිර්දේශය මත නම් කරනු ලබන, පහත දැක්වෙන පුහුණු ක්ෂේත්‍රයවලට අදාළ අධ්‍යයනාංශ හෝ අංශවල, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු (මූලාසන), මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, අධ්‍යයන අංශ ප්‍රධානියකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු :-

(i) පිළිසකර දන්තවේදය ;

(ii) ප්‍රශ්ලේෂක දන්තවේදය ;

(iii) දන්ත ව්‍යුහවේදය ;

(iv) දන්ත ඍජුකරණය ;

(v) ළමා දන්තවේදය ;

(vi) ප්‍රජා දන්ත සෞඛ්‍යවේදය ;

(vii) මුඛ හා හකු ශල්‍ය වෛද්‍ය වේදය ;

(viii) මුඛ වෛද්‍යවේදය ;

(ix) මුඛ ව්‍යාධිවේදය ;

(x) මූලික විද්‍යාවන් ;

(ඈ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂඥ වෛද්‍යවරයන් අතුරින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන විශේෂඥයන් දස දෙනෙකු, එනම් -

(i) දන්ත ඍජුකරණය, පිළිසකර දන්තවේදය, මුඛ ව්‍යාධිවේදය, සහ මුඛ හා හකු ශල්‍ය වෛද්‍යවේදය යන එකිනෙක විශේෂඥ ක්ෂේත්‍ර නියෝජනය කරමින් ජාතික දන්ත රෝහලේ, කොළඹ රෝහල් සමූහයෙන් විශේෂඥයන් සතර දෙනකු ;

(ii) ශික්ෂණ රෝහල්වලින් විශේෂඥයන් සිව්දෙනකු (දන්ත ඍජුකරණය සහ පිළිසකර දන්තවේදය යන එකිනෙක විශේෂඥ ක්ෂේත්‍රයෙන් දෙනෙකු බැගින්) ;

(iii) මහරෝහලෙන් විශේෂඥයින් දෙදෙනකු (දන්ත ඍජුකරණය සහ පිළිසකර දන්තවේදය යන එකිනෙක විශේෂඥ ක්ෂේත්‍රයෙන් එක් අයකු බැගින්) ;

(ඉ) ශ්‍රී ලංකා දන්ත ව්‍යාධිවේදය සහ මුඛදාන විද්‍යාලයේ පුහුණුකරුවන් වන විශේෂඥයන් තිදෙනකු (දන්ත ඍජුකරණය, පිළිසකර දන්තවේදය සහ මුඛ ව්‍යාධිවේදයෙන් එක් අයකු බැගින්). ඉහත සඳහන් කරන ලද විශේෂඥ ක්ෂේත්‍ර කවරකට හෝ නම් කිරීම සඳහා යෝග්‍ය සාමාජිකයකු නොමැති අවස්ථාවක දී, විද්‍යාලය විසින් දන්ත ඍජුකරණය, පිළිසකර දන්තවේදය සහ මුඛ ව්‍යාධිවේදය යන විශේෂඥ ක්ෂෙත්‍ර තුනෙන් කවර හෝ මීළඟ උචිත සාමාජිකයා නම් කරනු ලැබිය හැකි ය ;

(ඊ) ශ්‍රී ලංකා පොදු දන්ත වෘත්තිකයන්ගේ විද්‍යාලයේ එක් සාමාජිකයකු ;'';

(iii) එම ඡේදයෙහි (3ඈ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :-

''(3ඉ) මණ්ඩලය විසින්, මුඛ හා හකු ශල්‍ය වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් අධ්‍යයන සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එම අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඇ) පනත යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාලවල දන්ත වෛද්‍ය පීඨයන්හි අංශාධිපතිවරුන් විසින්, අදාළ අධ්‍යයනාංශවල නිර්දේශය සහිතව, නම් කරනු ලබන පහත දැක්වෙන පුහුණු ක්ෂේත්‍රවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහචාර්යවරයකු (මූලාසන), මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, අධ්‍යයන අංශ ප්‍රධානියකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු :-

(i) මුඛ හා හකු ශල්‍ය වෛද්‍ය විද්‍යා පුහුණු ක්ෂේත්‍රයෙන් එක් සාමාජිකයකු ;

(ii) මුඛ වෛද්‍ය පුහුණු ක්ෂේත්‍රයෙන් එක් සාමාජිකයකු ;

(ඈ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂඥ වෛද්‍යවරුන් අතරින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන විශේෂඥයන් අට දෙනකු -

(i) විශේෂිත රෝහල්වලින් මුඛ හා හකු ශල්‍ය වෛද්‍යවේදය අංශයේ විශේෂඥයන් දෙදෙනකු ;

(ii) ජාතික රෝහල්වලින්, ශික්ෂණ රෝහල්වලින් හෝ පළාත් මහ රෝහල්වලින් මුඛ සහ හකු වෛද්‍යවේදයේ විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනකු ;

(iii) දිස්ත්‍රික් සහ රෝහල්වලින් හෝ (අ) වර්ගයේ මූලික රෝහල්වලින් මුඛ සහ හකු ශල්‍ය වෛද්‍යවේදයේ විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනකු ;

(iv) මහරගම පිළිකා ආයතනයෙන් පිළිකා ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු ;

(ඉ) ශ්‍රී ලංකා මුඛ හා හකු ශල්‍ය වෛද්‍යවේද විද්‍යාලය මගින් නම් කරනු ලබන මුඛ සහ හකු ශල්‍ය වෛද්‍යවේද විශේෂඥයන් දෙදෙනකු (එක් සාමාජිකයකු විශ්වවිද්‍යාලයට අනුයුක්ත විය යුතු අතර අනෙක් සාමාජිකයා විශ්වවිද්‍යාලයකට අනුයුක්ත නොවිය යුතු ය) ;

(ඊ) අධ්‍යයන සභාවල සාමාජිකයන් -

(i) ශල්‍යවේදය අධ්‍යයන සභාව විසින් පත් කරනු ලබන එක් සාමාජිකයකු ;

(ii) වෛද්‍ය විද්‍යා අධ්‍යයන සභාව විසින් පත් කරනු ලබන එක් සාමාජිකයකු ;

(iii) නිර්වින්දනවේද අධ්‍යයන සභාව විසින් පත් කරනු ලබන එක් සාමාජිකයකු ;

(iv) දන්ත ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයන සභාව විසින් පත් කරනු ලබන එක් සාමාජිකයකු ;

(4) එහි 15 වන ඡේදයෙහි (3)(ආ) අනුඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''(ආ) අදාළ අධ්‍යයන සභාවක සාමාන්‍ය විධානය යටතේ උපදෙස්, අධ්‍යාපනය පුහුණුව සහ අගැයීම සිදු කරනු ලබන යම් පොදු හෝ උපවිශේෂඥ ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් විශේෂඥ සභාවක් පිහිටුවා ඇති අවස්ථාවක, එම විශේෂඥ සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(i) අධ්‍යක්ෂවරයා ;

(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(iii) පහත සඳහන් පරිදි පත් කරනු ලබන පරිදි වෙනත් සාමාජිකයන් දස දෙනකු :-

(අ) පුහුණු මධ්‍යස්ථාන නියෝජනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සාමාජිකයන් හතර දෙනකු දක්වා ;

(ආ) විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවලින් සාමාජිකයන් තිදෙනකු ;

(ඇ) රාජ්‍ය අංශයේ ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින අදාළ වෘත්තීය ආයතනයෙහි සාමාජිකයකු ;

(ඈ) විශේෂඥ ක්ෂේත්‍රයට අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වන සාමාජිකයන් දෙදෙනකු-

(ආඅ) (ආ)(iii)(අ) හෝ (ආ)(iii)(ඈ) අයිතම යටතේ උචිත වූ සාමාජිකයන් නොමැති අවස්ථාවක දී, විශේෂඥ ක්ෂේත්‍රයට අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් මගින් මෙම තනතුරු පිරවිය යුතු ය ;

(ආආ) ඉහත නිශ්චිතව දක්වන ලද සාමාජිකයන් දසදෙනා අතරින් සාමාජිකයන් උපරිම වශයෙන් දෙදෙනකු, වෛද්‍ය විද්‍යා නොවන හෝ දන්ත වෛද්‍ය විද්‍යා නොවන විෂය ප්‍රවීණයන් විය යුතු ය ;

(ආඇ) (ආ)(iii)(ඈ) අයිතමය හෝ (ආඅ) අනුඡේදය යටතේ පත් කරන ලද එක් සාමාජිකයකු පෞද්ගලික අංශය නියෝජනය කරන වෛද්‍ය විද්‍යා හෝ දන්ත වෛද්‍ය විද්‍යා විශේෂඥයකු විය යුතු ය ; සහ

(ආඈ) (ආ)(iii)(අ), (ආ)(iii)(ආ), (ආ)(iii)(ඈ) අයිතම සහ (ආඅ) අනුඡේදය සඳහා නම් කිරීම් අධ්‍යයන සභාව විසින් සිදු කළ යුතු අතර, (ආ)(iii)(ඇ) අයිතමය සඳහා නම් කිරීම් කළමනාකරණ මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.''.

(5) එහි 25 වන ඡේදයේ, ''වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය'' යන යෙදුමෙහි අර්ථ නිරූපණයේ ඇති ''මූලික සහ වෛද්‍ය විද්‍යාවන්'', ''ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව'' සහ ''විකලාංග ශල්‍ය වෛද්‍යවේදය හෝ වෙනත් යම් විශේෂඥ ක්ෂේත්‍රයක්'' යන වචන වෙනුවට ''මූලික වෛද්‍ය විද්‍යාවන්'', ''ක්‍රීඩා සහ ශාරීරික අභ්‍යාස වෛද්‍ය විද්‍යාව'' සහ ''විකලාංග ශල්‍ය වෛද්‍යවේදය, මුඛ සහ හකු ශල්‍ය වෛද්‍ය වේදය හෝ වෙනත් යම් විශේෂඥ ක්ෂේත්‍රයක්'' යන වචන ආදේශ කිරීමෙන්.''.

EOG 12 - 0380

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.